**කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**

# සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම

# පුරප්පාඩු

පූර්ණ වශයෙන් රජයට අයත් , ලාභදායී සහ ස්වයංමූල්‍ය ආයතනයක් වන සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම ශ්‍රී ලංකාවේ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන සහ අලෙවි කාර්යයන්හි නියැලෙන අතර, පහත පුරප්පාඩු තනතුරු සඳහා සුදුසු පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) තනතුර (HM1-1) – තනතුරු 01

**තනතුරට අදාළ රාජකාරී**

ඉංජිනේරු ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම, නව රසායනික නිෂ්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීම සහ ඒවා අධීක්ෂණය කිරීම, ආරක්ෂිත ක්‍රමෝපායන් නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

**සුදුසුකම් හා පළපුරුද්ද**

බාහිර අයදුම්කරුවන් (පහත අංක 1 හෝ 2 යටතේ දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.)

1. ඉංජිනේරු(රසායන) විෂය ක්ෂේත්‍රයට අදළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මූලික උපාධියක් සමග අදළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක සම්පූර්ණ සාමාජිකත්වය (corporate membership)

   **සහ**

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් අවුරුදු 15ක පළපුරුද්ද

2. තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම (Fellow Membership)

   **සහ**

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත සඳහන් විෂය අංක 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන්ට අදළ සුදුසුකම් සපුරා තිබීම
2. තනතුරට අදළ විෂය ක්ෂේත්‍රය තුළ කළමනාකරණ කාණ්ඩයට අයත් (MM) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**වයස :** වයස අවුරුදු 35ට නොඅඩු විය යුතු අතර, අවු. 55ට නොවැඩි විය යුතු වේ. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස්සීමාව අදළ නොවනු ඇත.

**වැටුප් පරිමාණය** HM 1-1

HM 1-1 2025 රු. [140,640 – 4,100X15 – 202,140]

මාසික වැටුප – කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව වැටුප් ගෙවනු ලැබේ.

## සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර (MM 1-1 ) – තනතුරු 01

**සුදුසුකම් හා පළපුරුද්ද**

බාහිර අයදුම්කරුවන් සඳහා : (පහත අංක 1 හෝ 2 යටතේ දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.)

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් අලෙවි/අලෙවි කළමනාකරණ/ව්‍යාපාර පරිපාලන/ව්‍යාපාර කළමනාකරණ යන විෂය ක්ෂේත්‍රවල උපාධියක් ලබා තිබීම සහ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව අදළ ක්ෂේත්‍රයේ තනතුරකට පත් වී අවම වශයෙන් අවුරුද්දක පළපුරුද්දක් ලබා තිබීම.

2) වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම මට්ටම සමත්ව තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක අදළ ක්ෂේත්‍රයේ තනතුරකට පත්වීමෙන් අනතුරුව අවම වශයෙන් අවුරුදු 1ක සේවා පළපුරුද්දක් ලබා තිබීම

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත අංක 1 හෝ 2 යටතේ දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් සපුරා තිබීම
2. තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදළ කනිෂ්ඨ කළමනාකාර (JM) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදළ නොවනු ඇත.

**වැටුප් පරිමාණය** MM 1-1

MM 1-1 – 2025 Rs. [91,690 – 2,480X10 – 3,450X15 – 168,240]

මාසික වැටුප – කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව වැටුප් ගෙවනු ලැබේ.

## කළමනාකරණ සහකාර (MA 1-2) - තනතුරු 04

**සුදුසුකම් (පොදු) :**

**බාහිර අයදුම්කරුවන් -**

**අධ්‍යාපනික :**

අ) පහත සඳහන් විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව අ.පො.ස (සා.පෙළ) විභාගයෙහි විෂයයන් හයක් එකවර සමත් වී තිබීම

i. සිංහල භාෂාව / දෙමළ භාෂාව    ii. ඉංග්‍රීසි භාෂාව    iii. ගණිතය

ආ) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙහි විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) සමත් වී තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :-** ප්‍රාථමික මට්ටම (පුහුණු සහ ප්‍රාථමික මට්ටම – නුපුහුණු) යන කාණ්ඩ වලට අයත් පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති සේවකයන් මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබති.

**අධ්‍යාපනික :** පහත සඳහන් විෂයයන් ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව අ.පො.ස. (සා.පෙ) විභාගයෙහි විෂයයන් හයක් සමත් වී තිබීම

i. සිංහල භාෂාව / දෙමළ භාෂාව    ii. ඉංග්‍රීසි භාෂාව    iii. ගණිතය

**වෙනත්**

ඉහත සඳහන් සේවක කාණ්ඩයට අයත් ස්ථිර තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**වැටුප් පරිමාණය** MA 1-2

රු. 46,220 – 540X10 – 630X7 – 1,080X12– 1,280X12 – 84,350/-

මාසික වැටුප – කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව වැටුප් ගෙවනු ලැබේ.

**වයස් සීමාව**

වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදළ නොවනු ඇත. .

## කාර්ය සහායක - PL 1 (තනතුරු 01)

**සුදුසුකම් :** අ.පො.ස (සා/පෙළ) විභාගයට පෙනී සිටීම

**වයස් සීමාව**

වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදළ නොවනු ඇත.

**වැටුප් පරිමාණය**

PL1 – 40,500 – 450X10 – 490X10 – 540X7 – 590X15 – 62,530/-

මාසික වැටුප – කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව වැටුප් ගෙවනු ලැබේ.

**ඉහත තනතුරු සඳහා පොදු කොන්දේසි**

- බඳවා ගැනීමේ දිනය වන විට අයදුම්කරු අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.
- රාජ්‍ය සේවයේ / අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදළ ආයතනවල ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්කරුවන් සිය ජීවදත්ත සහිත ආකෘතිමය ජීව දත්ත පත්‍රයක් (CV) සහ අදළ සහතික පිටපත් සහ ඥාති නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සඳහන් කරමින් ඉදිරිපත් කළ යුතුය.
- පුවත්පතේ දැන්වීම්වල දක්වුණු සුදුසුකම් සහිත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.
- අයදුම්කරුවන් නිරෝගී සහ යෝග්‍ය මානසික සෞඛ්‍යයකින් යුක්තවිය යුතු අතර, ශ්‍රී ලංකාව තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට හැකියාව තිබිය යුතුය.
- අසම්පූර්ණ හෝ ප්‍රමාද අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.
- සුදුසුකම් සහිතව සංක්ෂිප්ත කරනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.
- ලිඛිත හෝ/සහ ව්‍යුහගත සම්මුඛ පරීෂණයක් මගින් බඳවාගැනීම් සිදු කරනු ලැබේ.

ඉහත සුදුසුකම් සමග අයදුම්කරුවන් විසින් තමන් විසින් සකස් කරන ලද ජීව දත්ත පත්‍ර (CV) සහ සුදුසුකම් සහතික **2025.08.21** දිනට පෙර ලියාපදිංචි තැපැල මගින් පහත ලිපිනයට යොමු කළ යුතුය. ලිපි කවරයේ ඉහළ වම් පස අයදුම්කළ තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම,**
**නො.446, ගාලු පාර, රත්මලාන.**
**දු.ක. .0112 324466/ 0112 324465**
**pccl.lk**